# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජූලි 2016

## (AA22) පිරිවැය ගිණුම්කරණය හා වාර්තාකරණය

(Cost Accounting and Reporting)

---

මුළුමනින් ප්‍රශ්න 10 ක් සහිත කොටස් 4 කින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත විය. එමගින් පිරිවැය ගිණුම්කරණයට අදාල මූලික සංකල්ප පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබේ. අයදුම්කරුවන් සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු විය. භාවිත කළ යුතු කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රය සමග අමුණා තිබුණි. ප්‍රශ්න 10 සකසා තිබුණේ පහත සඳහන් පරිදිය:

**A – කොටස -** ලකුණු 20

එකකට ලකුණු 1 ක් හෝ 2 ක් බැගින් වූ එකිනෙකට වෙනස් ස්වරූපයෙන් යුතු වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න සහිත විය. සියලුම ප්‍රශ්න වලට උත්තර ලිවිය යුතු විය.

**B – කොටස -** ලකුණු 25

එකකට ලකුණු 5 ක් බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න පහකි.

**C – කොටස -** ලකුණු 30

එකකට ලකුණු 10 බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න තුනකි.

**D – කොටස -** ලකුණු 25

කොටස් දෙකකින් යුතු එක් අනිවාර්ය ප්‍රශ්නයකි. (A) කොටසට ලකුණු 13 කුත්, (B) කොටසේ (a) සඳහා ලකුණු 8 ක් සහ (b) සඳහා ලකුණු 4 ක් වශයෙනි.

ප්‍රශ්න පත්‍රයේ ප්‍රමිතිය හා අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි. දී තිබූ උත්තර වලින් පෙනීගිය කාරණයක් වූයේ අයදුම්කරුවන්ගේ බහුතරය වෙත් කර තිබූ කාලය නිසිලෙස කළමනාකරණය කරගෙන තිබූ බවයි. එක් එක් ප්‍රශ්නය සඳහා ගතයුතු කාලය පිළිබඳ මාර්ගෝපදේශය වෙන් කළ ලකුණු මගින් සපයා තිබේ.

## A - කොටස

(වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)

(ලකුණු 20)

### ප්‍රශ්න අංක 01

නැවත ඇණවුම් මට්ටම, පොදුකාර්ය පිරිවැය අවශෝෂණය කිරීම වැනි වූ මූලික පිරිවැය ගිණුම්කරණ මූලධර්ම සහ මූලික ගණනය කිරීම් පිළිබඳව මෙම ප්‍රශ්න ප්‍රධාන වශයෙන් කේන්ද්‍රගත වී තිබුණි. අයදුම්කරුවන් සියලු දෙනාම වාගේ මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණේය. ලකුණු 20 න් ලකුණු 15 කට වඩා සමහරු ලබා තිබුණි. ප්‍රශ්න අංක 1.7 සඳහා ලකුණු 4 ලබා ගැනීමට අයදුම්කරුවන්ගෙන් සැහෙන ගණනක් අසමත් විය. ඇතැම් අයදුම්කරුවන්ට ප්‍රමිත පිරිවැය පද්ධතිය, ක්‍රියාකාරකම් පදනම් වූ පිරිවැයකරණය, ශුන්‍ය පාදක අයවැය පිළිබඳ පැහැදිලි දැනුමක් තිබුණේ නැත.

වාස්තවික වර්ගයේ ප්‍රශ්නයකට උත්තර ලිවිය යුත්තේ කෙසේදැයි සමහර අයදුම්කරුවන් දැන සිටියේ නැත. ඔවුන් සම්පූර්ණ ප්‍රශ්නය උත්තරයද සමග නැවත ලියා තිබෙනු දක්නා ලදි. අනවශ්‍ය වැඩ සඳහා ඔවුන්ගේ කාලය වැය කර ඇත.

මෙබඳු වර්ගයේ ප්‍රශ්න නිසිලෙස විසඳීම සඳහා අයදුම්කරුවන් පිරිවැය ගිණුම්කරණයේ මූලික සංකල්ප පිළිබඳව දැනුවත් වී තිබිය යුතුය.

## B කොටස

(එකකට ලකුණු 5 බැගින් අනිවාර්ය ප්‍රශ්න 5 කි)

(මුළු ලකුණු 25)

### ප්‍රශ්න අංක 02

ශ්‍රම පිරිවැය යටතේ වැටුප් හා වේතන ක්‍රම පිළිබඳව මෙම ප්‍රශ්නය ප්‍රධාන වශයෙන් කේන්ද්‍රගත කර තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම ප්‍රශ්නයට ලකුණු ලබා තිබුණේ නැත. සැහෙන අයදුම්කරුවන් පිරිසක් පැය විනාඩි වලට පරිවර්තනය කිරීමට කාලය අපතේ යවා තිබුණි.

අයදුම්කරුවන්ගෙන් බහුතරයක් පැයකට ගෙවිය යුතු ප්‍රසාද දීමනාවේ ප්‍රමාණය නිවැරදි ලෙස ගණනය කර තිබූ නමුත් අතිරේක පැය ගණන නිසිලෙස සොයා ගැනීමට ඔවුන්ට නොහැකි වී ඇත. අතිරේක නිෂ්පාදන ප්‍රමාණය කමිස 20 ක් ලෙස නිකම්ම අදාල කරවාගෙන තිබුණි.

මෙවැනි ගැටළු සම්බන්ධයෙන් වන පෙර විභාග ප්‍රශ්න වලට උත්තර ලියා අධ්‍යයනය කර පුරුදු පුහුණු වීම අයදුම්කරුවන් විසින් කළ යුතුය.

### ප්‍රශ්න අංක 03

ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු (FIFO) ක්‍රමය භාවිතයෙන් තොග ඇගයීම කිරීම ප්‍රධාන වශයෙන් කේන්ද්‍ර කරගෙන මෙම ප්‍රශ්නය ඇතුලත් කර තිබේ. අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. අයදුම්කරුවන්ගෙන් සුළු පිරිසක් ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු ක්‍රමය යටතේ නිකුත් කිරීමේ පිරිවැය ගණනය කිරීමට අපොහොසත් විය. තවද, අයදුම්කරුවන්ගෙන් ඉතා සුළු පිරිසක් තොග ලෙජරයේ නිවැරදි ආකෘතිය යොදාගෙන තිබුණේ නැත.

අයදුම්කරුවන් තොගවල ද්‍රව්‍ය නිකුතු මිල කිරීම් සහ ඇගයීම් පිළිබඳ විවිධ ක්‍රම පුරුදු පුහුණු විය යුතුය.

### ප්‍රශ්න අංක 04

නිෂ්පාදන අයවැයක් පිළියෙල කිරීම සම්බන්ධයෙන් වන අයදුම්කරුවන්ගේ දැනුම මෙම ප්‍රශ්නයෙන් විමසා බලන ලදි. අයදුම්කරුවන්ගෙන් බහුතරය ප්‍රශ්නයේ අවශ්‍යතාවය නිසිලෙස කියවාබලා නැති බව පෙනුණි. ප්‍රශ්නයේ අවශ්‍යතාවය වෙනුවට මූල්‍ය ගිණුම්කරණය යටතේ වෙළෙඳ ගිණුමක් පිළියෙල කිරීම අයදුම්කරුවන් කිප දෙනෙකු විසින් සිදු කර තිබුණි.

සමහර අයදුම්කරුවන් නිෂ්පාදන අයවැයක් නිසිලෙස පිළියෙල කිරීමට අපොහොසත් විය. නිෂ්පාදන අයවැය පිළියෙල කිරීම සඳහා ආරම්භක සහ අවසාන තොග යොදාගැනීම පිළිබඳ දැනුම නොතිබූ බව දී තිබූ උත්තර වලින් නිරීක්ෂණය විය.

ප්‍රශ්නයට උත්තර ලිවීමට පෙර ප්‍රශ්නය අවධානයෙන් කියවා අවශ්‍ය දෑ වටහා ගැනීමට අයදුම්කරුවන් වගබලා ගත යුතුය.

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නය ප්‍රධාන වශයෙන් කේන්ද්‍රගතව තිබුණේ කාර්යය පිරිවැයකරණය (job costing) හා මිලකරණය (pricing) කෙරෙහිය. ප්‍රශ්නය මගින් අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා කර තිබුණේ කාර්යයක් සඳහා මිල ගණනය කිරීමටයි.

අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 2-3 ක් පමණක් ලබාගෙන තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් සුළු ප්‍රමාණයක් සම්පූර්ණ ලකුණු උපයාගෙන තිබුණි. සරල ගණනය කිරීමක් පමණක් අවශ්‍ය වූ නමුදු සමහර අයදුම්කරුවන් කාර්යය සඳහා ලාභය නිවැරදිව ගණන් බලා නොතිබුණි. සමහර අයදුම්කරුවන් කාර්යයයේ මුළු ඍජු පිරිවැය මත ලාභාන්තිකය ගණන් බලා ඇත. ඔවුන් පොදුකාර්ය නොසලකා හැර තිබේ. මෙබඳු සරල ප්‍රශ්න සඳහා සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට, අයදුම්කරුවන් ප්‍රශ්නය අවධානයෙන් කියවා, නිවැරදි ක්‍රම අනුගමනය කරමින් තම අංක ගණිතමය නිරවද්‍යතාවය දියුණු කරගත යුතුය.

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නය ප්‍රධාන වශයෙන් කේන්ද්‍රගත වී තිබුණේ සමච්ඡේද ලක්ෂ්‍යය ගණනය කිරීම හා ඒකක වලින් සුරක්ෂිත ආන්තිකය ගණනය කිරීම වෙතය.

අයදුම්කරුවන්ගෙන් බහුතරය මාසික ස්ථාවර පිරිවැය ගණනය කර නොතිබුණි. සමච්ඡේද ලක්ෂ්‍යය ගණනය කිරීමට ඔවුන් වාර්ෂික ස්ථාවර පිරිවැය කෙලින්ම යොදාගෙන ඇත. එමනිසා, බහුතරයකට සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට හැකි වුයේ නැත.

මෙබඳු වර්ගයේ ප්‍රශ්නවලට උත්තර ලියා අයදුම්කරුවන් පුරුදු පුහුණු විය යුතුය.

<u>C කොටස</u>

(එකකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 3 කි)

(මුළු ලකුණු 30)

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නය ප්‍රධාන වශයෙන් කේන්ද්‍රගත වී තිබුණේ මාසික පදනම මත මුදල් අයවැය පිළියෙල කිරීම කෙරෙහිය.

උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි. අයදුම්කරුවන් බොහෝ දෙනෙකු නිවැරදිව ආදායම ගණනය කිරීම හා පුරෝකථනය කිරීම සිදුකර තිබූ අතර වියදම් පුරෝකථනය ද නිවැරදිව සිදුකර තිබුණි.

අයදුම්කරුවන්ගෙන් බහුතරයක් ලකුණු 7 - 9 ත් අතර ලබා තිබුණේය. අයදුම්කරුවන් කිහිප දෙනෙකු මාසික පදනමට මුදල් අයවැය පිළියෙල කර නොතිබූ අතර, ඒ වෙනුවට මුළු එකතුව භාවිත කර සම්පූර්ණ කාර්තුවටම අයවැය පිළියෙල කර තිබුණි. අයදුම්කරුවන් බොහෝ දෙනෙකු යන්ත්‍රය අත්පත් කර ගැනීමේ පිරිවැය, මුදල් පිටත ගැලීමක් ලෙස සලකනවා වෙනුවට මුදල් ඇතුලට ගැලීමක් ලෙස වැරදි ආකාරයට සළකා තිබුණි.

සාර්ථකව ලකුණු ලබාගැනීම සඳහා අයදුම්කරුවන් මේ ආකාරයේ ප්‍රශ්න වලට වැඩියෙන් උත්තර ලියා පුහුණු විය යුතුය.

## ප්‍රශ්න අංක 08

පොදුකාර්ය නිෂ්පාදන සහ සේවා දෙපාර්තමේන්තු වෙත වෙන්කර දීමත් එක් එක් සේවා දෙපාර්තමේන්තුවට අදාල පොදුකාර්ය නැවත නිෂ්පාදන දෙපාර්තමේන්තු වලට විභජනය කිරීමත් සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ හැකියාව පරීක්ෂා කිරීම කෙරෙහි මෙම ප්‍රශ්නය යොමු වී ඇත.

අයදුම්කරුවන් බහුතරයක් මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණි. නිෂ්පාදන දෙපාර්තමේන්තු හා සේවා දෙපාර්තමේන්තු අතර පොදුකාර්ය පිරිවැය වෙන් කිරීමේ පදනම නිවැරදි ආකාරයෙන් අයදුම්කරුවන්ගෙන් බහුතරය යොදාගෙන තිබූ ආකාරය උත්තර වලින් නිරීක්ෂණය විය. මේ සඳහා නිවැරදි ප්‍රතිශතයන්ද යොදාගෙන තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරය ලකුණු 7-8 ආසන්නව ලබා තිබේ.

වක්‍ර ද්‍රව්‍ය සහ වක්‍ර වේතන නොසලකා ප්‍රකාශන පිළියෙල කල අයදුම්කරුවන් කිහිප දෙනෙක්ද සිටියහ. මෙවැනි ප්‍රශ්න වලට උත්තර ලිවීමට අයදුම්කරුවන් පුහුණු විය යුතුය.

## ප්‍රශ්න අංක 09

මෙම ප්‍රශ්නය ප්‍රධාන වශයෙන් කේන්ද්‍රගත වී තිබුණේ පිරිවැය ගිණුම් හා මූල්‍ය ගිණුම් අතර ලාභය සැසඳීමේ ප්‍රකාශනයක් පිළියෙල කිරීම කෙරෙහිය. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් තොග වලට අදාල නොවන එනම්, ආදායම් බදු හා ක්ෂය පිළිබඳව නිවැරදිව හඳුනාගෙන ගැලපීම් ගණනය කර තිබුණි. කෙසේවෙතත්, සමස්තයක් වශයෙන් ගත්කල මෙම ප්‍රශ්නයට උත්තර සැපයීමේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක තිබුණේ නැත. අයදුම්කරුවන් සැහෙන ගණනක් 6 - 9 දක්වා ලකුණු ලබාගෙන ඇත. අයදුම්කරුවන්ගෙන් වැඩි පිරිසක් ගිණුම් කට්ටල දෙකක් අතර සැසඳීම පිළිබඳ සංකල්පය නිසිපරිදි අවබෝධ කරගෙන තිබුණේ නැත. තවද, තොග ඇගයීමේ බලපෑම නිවැරදිව ලාභයට ගලපා නොතිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරය ගිණුම් කට්ටල දෙකේ ගැලපීම් වෙනවෙනම සිදුකර තිබුණි. අයදුම්කරුවන්ගෙන් සුළු පිරිසක් ක්‍රම දෙක යටතේම ලාභය වෙන වෙනම ගණනය කරමින් ඔවුන්ගේ කාලය අපතේ යවා තිබුණි.

උත්තර ලිවීමට පෙර අවධානයෙන් ප්‍රශ්නය කියවීම වැදගත්ය. තවද අයදුම්කරුවන් පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වලට උත්තර ලියා ස්ව-අධ්‍යයන පාඩම්පොත පරිශීලනය කර පුහුණුව ලබා ගත යුතුය.

## D කොටස

(අනිවාර්ය ප්‍රශ්නයකි)

(ලකුණු 25)

## ප්‍රශ්න අංක 10

**A කොටස** (වෙන්කල ලකුණු 13)

මෙම ප්‍රශ්නය ප්‍රධාන වශයෙන් කේන්ද්‍රගත වී තිබුණේ පෙරසැරි පිරිවැයකරණය පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීමටය.

මෙම ප්‍රශ්නය මගින් පෙරසැරි ගිණුමක් පිළියෙල කිරීම අවශ්‍ය විය. උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය. අයදුම්කරුවන්ගෙන් සැහෙන පිරිසක් නොනිමි වැඩ ගණනය කරන්නේ කෙසේද, අසාමාන්‍ය ලාභයේ සහ නිමි භාණ්ඩවල වටිනාකම් ගණනය කරන්නේ කෙසේදැයි දැන සිටියේ නැත. ඔවුන්ට හැකිවූයේ කෙලින්ම දී තිබෙන අගයන් විශේෂයෙන් සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ පොදුකාර්ය පෙරසැරි ගිණුමේ නිවැරදිව සටහන් කිරීමට පමණි. ඒ කොටසට ඔවුන් ලකුණු ලබා ඇත. නිමිභාණ්ඩ සහ නොනිමි භාණ්ඩවල වටිනාකම්ද සුන්බුන් අගයද අයදුම්කරුවන්ගෙන් බහුතරය නිවැරදිව ගණනය කර නොතිබුණි. ඒකකයක පිරිවැය ගණනය කිරීමේදී සමහර අයදුම්කරුවන් සාමාන්‍ය අපතය සලකා බලා නැත. නැතහොත් සාමාන්‍ය අපතය සඳහා වැරදි අගයක් සලකා බලා ඇත.

**B කොටස (a)** (වෙන්කල ලකුණු 08)

විචලනයන් ගණනය කිරීම කෙරෙහි කේන්ද්‍රගතව තිබුණි. උත්තර සැපයීමේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක නැත. අයදුම්කරුවන්ට මෙම ක්ෂේත්‍රය පිළිබඳව පැහැදිලි දැනුමක් නැති බව නිරීක්ෂණය විය. සූත්‍රයට සංඛ්‍යා ආදේශ කිරීමේදී සමහර අයදුම්කරුවන් වැරදි සිදුකර ඇත. ඔවුන්ගෙන් සමහරක් විචලනය "අවාසි" හෝ "වාසි" දැයි දක්වා නැත. එමනිසා වෙන්කල මුළු ලකුණු ලබා ගැනීමට නොහැකි විය.

ඔවුන්ගේ දැනුම දියුණු කර ගැනීමට සමාන පසුගිය විභාග ප්‍රශ්න වලට උත්තර ලියා පුහුණු විය යුතුය.

**B කොටස (b)** (වෙන්කල ලකුණු 04)

මෙම කොටසෙන් අවශ්‍ය කලේ අයදුම්කරුවන් විසින් ප්‍රමිත පිරිවැයකරණයේ වාසි 4 ක් සඳහන් කිරීමය. මෙය න්‍යායාත්මක ප්‍රශ්නයකි. වෙන්කල සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට අයදුම්කරුවන් බොහෝ දෙනෙකුට නොහැකි විය. මෙම ප්‍රශ්න පත්‍රයේ වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න වල ඉස්මතු කර තිබූ සංකල්ප භාවිත කර සමහර අයදුම්කරුවන් උත්තර ලිවීමට උත්සහා කර ඇති බව උත්තර වලින් පෙනුණි. විශේෂයෙන් ප්‍රශ්න අංක 1.7 (1) හි දැක්වෙන "සමාගම් වල ව්‍යවස්ථාපිත වාර්තාකරණ අවශ්‍යතාවයන් සපුරා ලීම සඳහා ප්‍රමිත පිරිවැයකරණ ක්‍රමය බහුල වශයෙන් භාවිත කරනු ලැබේ" යන්න මෙම කොටසට නිවැරදි උත්තරය ලෙස සලකා අයදුම්කරුවන්ගෙන් බහුතරයක් නැවත ලියා තිබුණි.

\- - -

**<u>අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම වැඩිදියුණු කර ගැනීම සඳහා සැළකිල්ලට ගතයුතු පොදු කරුණු:</u>**

(1) විෂය නිර්දේශය මුළුමනින්ම අධ්‍යනය කිරිම.

(2) ප්‍රශ්න පත්‍රය ඔබට ලැබුණු පසු එහි දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවන්න (ඒ සඳහා අමතර කාලයක් දෙනු ලැබේ).

(3) අයදුම්කරුවන් අවධානයෙන් ප්‍රශ්නය කීප වතාවක් කියවා අවබෝධ කරගත යුතුය. ප්‍රශ්නය සඳහා සෘජු නිවැරදි උත්තරයක් අපේක්ෂා කර තිබෙන විට අනවශ්‍ය පැහැදිලි කිරීම් සහ විස්තර නොලිවිය යුතුය.

(4) විභාගයේදී කාර්යක්ෂම ලෙස කාලය කළමනාකරණය කරගන්න.

(5) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංකය සහ ඔබේ විභාග අංකය නිවැරදිව ලියා තිබේදැයි දෙවරක් පරික්ෂා කරන්න.

(6) කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථන වලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

(7) අත් අකුරු කියවිය හැකි මට්ටමට තිබීම හා උත්තර වලට ප්‍රශ්න අංක නිසිලෙස යොදා තිබීම ගැන සහතික විය යුතුය.

(8) ස්වඅධ්‍යයන පාඩම්මාලා පොත්, ලිපි සඟරා ආදිය කියවිය යුතුය.

(9) ඔබේ දැනුම වැඩිදියුණු කිරීමට, පෙර ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කර උත්තර ලියා පුහුණු විය යුතුය.

(10) හොඳ සූදානමකින් විභාගය සමත්වීමේ පරම චේතනාව පෙරටුකොටගෙන විභාගයට මුහුණ දීම.

- * * * -